ප්‍රසම්පාදන දැන්වීම

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

ගාල්ල ධීවර වරායේ දැනට පවතින දියත්මග (Slipway) ප්‍රතිස්ථාපනය කිරීම, නව වේදිකා බැම්ම (Quay-Wall) හානි වූ කොටස් නැවත සැකසීම සහ හානි වූ වැසුම් පුවරු (Cover Slabs) ප්‍රතිස්ථාපනය කිරීම

කොන්ත්‍රාත් අංකය : CFHC/PD/RDQWSW/GAL/2026-113

1. "ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව" වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් ඉහත සඳහන් කාර්යය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම කාර්යයට දැනට පවතින දියත්මග (Slipway) ප්‍රතිස්ථාපනය කිරීම, නව වේදිකා බැම්මේ හානි වූ ප්‍රදේශය නැවත සැකසීම සහ හානි වූ වැසුම් පුවරු (Cover Slabs) ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළත් වේ. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රමවේදය ඔස්සේ සිදු කරනු ලබයි.

2. CIDA ලියාපදිංචිය අවශ්‍ය වේ.
   - ශ්‍රේණිය : ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී C6 හෝ ඊට ඉහළ
   - විශේෂතාව : සාගර ඉදිකිරීම් (Maritime Construction)

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.11.04 සිට 2026.11.25 දක්වා ඕනෑම වැඩකරන දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ රු. 8,000.00 ක ආපසු නොගෙවන ලබන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, **"ප්‍රසම්පාදන කළමනාකරු, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** වෙත ව්‍යාපාරික ලිපි ශීර්ෂයක් මත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද ප්‍රසම්පාදන ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. මුදු, තැබූ ලංසු 2026.11.26 දින පෙ.ව. 11.00 ට විවෘත කරනු ලැබේ.

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නිල වෙබ් අඩවිය (www.cfhc.gov.lk හි Procurement ටැබය යටතේ) සහ www.promise.lk ඔස්සේ සම්පූර්ණ තොරතුරු (ලංසු සඳහා ආරාධනය - Invitation for Bids) ලබාගත හැක.

5. පූර්ව ලංසු රැස්වීම 2026.11.13 වන දින පෙ.ව. 10.30 ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක. 15, රොක් හවුස් පටුමග, කොළඹ 15 හි දී පැවැත්වේ.

6. වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා කරුණාකර වැඩබලන කළමනාකරු (ප්‍රසම්පාදන) දුරකථන අංක (011-2525063) ඔස්සේ ලබාගත හැකිය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
නො. 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.